# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2196/5 - 2020 ඔක්තෝබර් මස 05 වැනි සඳුදා - 2020.10.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ විනෝද බදු පැනවීම

(267 වන අධිකාරිය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මහනුවර කඩවත් සතර ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2020.03.12 වන දින පැවති මහා සභා රැස්වීමේ තීරණ අංක 05.01 යටතේ තීරණය කරන ලද පහත සඳහන් යෝජනාව ඉහත කී විනෝද බදු ආඥාපනතේ දෙවන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර ලලිත් යූ. ගමගේ වන මා විසින් අනුමත කරන ලද බවට එකී උපවගන්තිය අනුව මෙයින් පළකරනු ලැබේ.

**නීතිඥ ලලිත් යූ. ගමගේ,**
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.

2020 අගෝස්තු මස 26 වැනි දින,
ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් හා 1984 අංක 37 දරන විනෝද බදු සංශෝධිත පනත ප්‍රකාරව මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිදුකරන සෑම විනෝද කටයුත්තකින්ම විනෝද බද්දක් පනවා අයකර ගැනීමටත්, එම විනෝද කටයුත්ත -

(අ) සිනමා දර්ශනයක් වන විට ඒ සඳහා ඇතුළත් කරගන්නා තැනැත්තාගෙන් අයකර ගන්නා මුදල් ප්‍රමාණයෙන් සියයට හතයි දශම පහ (7.5%) ක ප්‍රමාණයට සමාන මුදල් ද ; සහ

(ආ) වෙනත් විනෝද කාර්යයක් වන විට ඒ සඳහා ඇතුළත් කර ගන්නා තැනැත්තාගෙන් අයකර ගන්නා මුදල් ප්‍රමාණයෙන් සියයට දහය (10%)ක ප්‍රමාණයට සමාන මුදල් ද අය කිරීමටත් යෝජනා කරමි.

10 - 773

1A - G 33040 — 25 (2020/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*